සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade 7 | විෂයය / பாடம் / Subject : කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I,II

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) 3 | (2) 4 | (3) 4 | (4) 2 |
| (5) 4 | (6) 1 | (7) 2 | (8) 1 |
| (9) 2 | (10) 4 | (11) 1 | (12) 3 |
| (13) 2 | (14) 3 | (15) 2 | (16) 2 |
| (17) 3 | (18) 1 | (19) 3 | (20) 1 |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

(01) (1) ''මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ කී වචනය ලෙස මට සිදුවේවා.''

(ලකුණු 02)

(2) මනාලයා හා මනාලිය (ලකුණු 02)

(3) දරුවන්ට ආදරය/ රැකවරණය/ මඟ පෙන්වීම ලබාදීම
ඔවුන් පෝෂණය කිරීම
නියමිත වයසේ දී ඔවුනට ප්‍රසාද නිධාන ලබාදීම
කතෝලික විශ්වාසය තුළ ඇති දැඩි කිරීම
දරුවන්ට පූර්ණ අධ්‍යාපනයක් ලබාදීම....... ආදී ලෙස (ලකුණු 04)

(4) නිවසේ වැඩ කටයුතුවලට සහයෝගය ලබාදීම
නිවෙස් පිරිසිදු කර තබා ගැනීම
සහෝදර, සහෝදරියන් රැක බලා ගැනීම
වගා කටයුතුවලට, තම ශ්‍රමය ලබාදීම
ආර්ථික ප්‍රශ්න ඇත්නම්, ඒවා නිරාකරණයට සහාය දැක්වීම..... ආදී ලෙස (ලකුණු 04)

(5) දෙව්මව් බැහැපත් වූවා සේ - අපත් අන් අයට පිහිටවීම
ජේසුස් වහන්සේව දේව මාලිගාවේ කැප කළා සේ - අපත් ආදර්ශවත් කිතුනු ජීවිතයක් ගත කළ යුතුයි.
පවුලේ ප්‍රධානියා සේ ජුසේතුමා තම පවුල රැකගන්නා සේ - අප සැමත් අප පවුල රැක බලා ගත යුතුයි.
ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන්, කාය ශක්තියෙන් වැඩුනාහ - අපත් එලෙස අපේ කටයුතු යහපත්ව කර ගනිමින් වැඩි වර්ධනය විය යුතුයි.
කරදර අවස්ථාවල, පවුලේ අය අත්නොහැරිය යුතුයි.

කුරුස පාමුල තම අම්මාව, ජොහන්ට භාර දුන්නා සේ, අපගේ මව්පියන් වයෝවෘද්ධ වන විට රැකබලාගත යුතුයි.

(මුළු ලකුණු 2 + 2 + 4 + 4 + 4 = 16)

(02) (1) පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනය (ලකුණු 02)

(2) 1. කීකරුකම
2. ව්‍රත ශුද්ධිය
3. දිළිඳුකම (ලකුණු 03)

(3) පැවිදි සොයුරියන්ගේ නිකායයන්
ශුද්ධ වූ පවුලේ නිකාය
යහපත් එඬේරාගේ නිකාය
සුරදූත නිකාය
අපොස්තලික කාර්මෙල් පැවිදි සොයුරියන්
දිව්‍ය ගැලවුම්කරුවන්ගේ පැවිදි සොයුරියන්
සිරි කුරුස පැවිදි සොයුරියන්
දොමිනිකාන පැවිදි සොයුරියෝ........ ආදි ලෙස (ලකුණු 06)

(03) (1) ප්‍රසාද ස්නාපන පූර්ව ආලේපය (OC)
ක්‍රිස්මා තෛලය (SC) (ලකුණු 02)

(2) දරුවාට දෙන ක්‍රිස්තියානි නම විමසීම
දෙමව්පියන් හා ඥාන මව්පියන් වෙත වගකීම් පැවරීම
ළදරුවාගේ නළලේ, කුරුසියේ ලකුණ, සලකුණු කිරීම
දේව වාක්‍ය පිළිවෙත/ විශ්වාසකයින්ගේ යාච්ඤා උච්චාරණය
සාන්තුවර පිහිට යැදීම/ දුෂ්ටාත්ම දුරු කිරීමේ යැදුම
ශුද්ධ වූ තෛල ආලේපය
ප්‍රසාද ස්නාපන පොරොන්දු දීම
සුදු වස්ත්‍රය පැළඳවීම
පාස්කු ඉටිපහනින්, ඉටිපහන් දැල්වීම..... ආදී ලෙසින් (ලකුණු 03)

(3) යහපත් නායකත්ව ගුණාංග 6ක් ඉදිරිපත් කර ඇත්නම් (ලකුණු 06)

(04) (1) ඒසව් හා ජාකොබ් (ලකුණු 02)

(2) ජාකොබ් පොරොන්දු දේශය කරා එන විට, එක් රාත්‍රියක දී මිනිසෙක් ඔහු සමග පොර බැදීම හා ඉන් ජය නොලැබෙන විට ඔහුගේ කලවා සන්ධියට පහරක් ගැසීම.
ඔහුට යන්නට ඉඩ නොදෙන විට, ඔහුගේ ආශිර්වාදය ඉල්ලා සිටීම හා ඔහුගේ නම 'ජාකොබ්' යයි දැනගැනීම
මින්පසු ඔබේ නම 'ජාකොබ්' නොව ඔබ දෙවියන් වහන්සේ හා මනුෂ්‍ය සමඟ පොරබඳන ජයගත් බැවින් ඔබේ නම 'ඊශ්‍රායෙල්' වන්නේ යැයි පැවසීම (ලකුණු 03)

(3) වරදක් කළ විට එම වරද පිළිගත යුතු ය.
වරදට සමාව ලබා ගත යුතුය.
තමාට වැරදි කළ අයට සමාව දිය යුතුයි.
වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද සමගි විය යුතුයි.
වැරදි නොවන ආකාරයෙන් සහෝදරයන් සමඟ සමගියෙන් ජීවත් විය යුතුයි

අන් අයට සමාව දෙන අයට, දෙවියන් වහන්සේ ද සමාව දෙන සේක. (ලකුණු 06)

(05) (1) ගුරුවරයා / හෙදිය / රියැදුරා / ගොවියා / වෙද මහතා (ලකුණු 02)

(2) පෙළ පොතේ 56ට අනුව දිවැසිවර / පූජක / එඬේරික ලෙස කුමන ආකාරයෙන් හෝ අදාළව ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 03)

(3) ධර්මදූත ළමා සමාජය
ළමා ක්‍රියාකාරී වීරයෝ
මරිය හමුදාව
වින්සන් ද පාවුලා සමිතිය
පූජා උදව් සමිතිය
ගීතිකා කණ්ඩායම
දිව්‍ය හෘදයේ සමිතිය (ලකුණු 06)

(06) (1) ආත්මික සුවය ලබා ගැනීමට
පවුලක්, මීසමක් ලෙස එකතුව දෙවියන්ට වන්දනා කිරීමට
ලද වරප්‍රසාද වලට තුති දීමට
වන්දනා ස්ථාන දැක බලා ගැනීමට (ලකුණු 02)

(2) ඉන්දියාවේ - ගෝව, වේලන්කන්නි
ප්‍රංශය - ලූර්දුව
පෘතුගාලය - පාතිමා නුවර
රෝමය - පාදුවා ඇතුළු ස්ථාන
ශුද්ධ වූ දේශය (ලකුණු 03)

(3) අදාළ ලෙස පත්‍රිකාවක් සකසා ඇත්නම් සුදුසු ලෙස ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(07) (1) (i) සාමාන්‍ය ජපමාලය (ii) මළවුන්ගේ ජපමාලය (ලකුණු 02)

(2) පවුලේ අය සවස එකතු වී යැදුම් කරන විට
දේවමාතා නුවාන වල දී (උදා: මැයි මංගල්‍යය)
දිව්‍ය පූජාවක් ආරම්භ කිරීමට පෙර, මීසම් සංසයක් ලෙස
තීරණාත්මක හා මතභේදකාරී අවස්ථාවල.... ආදී ලෙස (ලකුණු 03)

(3) 'සොරකම් නොකරව' යන පණත ආරක්ෂා කිරීමට - ලද දෙයින් සතුටු වීම / අන් සතු දේවලට ආශා නොකිරීම / ඒවා තබා නොගැනීම / කිසිවක් සොරකම් නොකිරීම / සාධාරණත්වය ඇති කිරීම / අන් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම / අන් අයට ලැබිය යුතු දේ ලබාදීම / ආත්ම දමනය ඇතිකර ගැනීම / සරල ජීවිත රටාවක් අනුගමනය කිරීම / ඉල්ලා ගත් දෙයක් නැවත ලබාදීම (ලකුණු 06)